**උඩුදුම්බර ප්‍රාදේශීය සභාව - 2023**
**----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

උඩුදුම්බර ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට උඩුදුම්බර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතී,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) ප්‍රාදේශීය සභාවේ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගෙන තිබුණු රු. 322,930 ක ස්ථාවර වත්කම් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ තොග මිලදී ගැනීම් රු. 95,390 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | 2017 සිට 2021 වර්ෂය දක්වා කාලය තුළ ව්‍යාපෘති 23 ක රු. 1,287,242 ක් ණය ගැති ශේෂ නිරවුල් කර තිබියදී තව දුරටත් ණය ගැතියන් යටතේද ගෙවීම් අවසන් කල ව්‍යාපෘති 82 ක වටිනාකම වූ රු. 1,969,797 ණය හිමියන් යටතේද ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඈ) | 2019 වර්ෂයේ ඉටු කිරීමට යෝජිතව රු. 100,000 ක් ණයගැති කළ හපුකන්ද නැගෙනහිර අරඹේළිද හා පිවිසුම් මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති ඉටු කර නොතිබියදී සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් තව දුරටත් ණයගැතියන් හා ණය හිමියන් යටතේ ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුළ ගිවිසුම්ගත නොවූ එකතුව රු. 300,000 ක ව්‍යාපෘති 03 ක් ණය හිමියන් යටතේ ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කරන බව. | -එම- |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාතර්ා

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට මූල්‍ය ප්‍රකාශන අනුව පුස්තකාල පොත් ශේෂය රු.3,594,222 ක් වුවද පරිග්‍රහන ලේඛනයට අනුව රු. 2,186,768 ක් වූයෙන් රු. 1,407,454 ක වෙනසක් පැවතුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | වෙනස හඳුනාගෙන ගිණුම්පිළියෙල කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | ඉදිරියේදී සමීක්ෂණයක් සිදුකරන බව | පනතේ විධිවිධාන කටයුතු කළ යුතුය. |
| (ආ) | නිවාස හා නගර සංවර්ධන ආඥා පනතේ 12(1) ඒ | 2021 සිට සමාලෝචිත වර්ෂය අවසාන දිනය දක්වා කාලය තුල සංවර්ධන බලපත්‍රයක් ලබා නොගෙන ගොඩනැගිලි 57 ක් ඉදිකර තිබුණද සභාව කිසිදු ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි. | අවිධිමත් ඉදිකිරීම් සම්බන්ධයෙන් පියවර ගන්නා බව | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මු.රෙ. 104(3) හා 104(4) | 2018 සිට 2020 කාලය තුළ අනතුරට පත් වූ වාහන 02 කින් එක් වාහනයක මු.රෙ. පරීක්ෂණ අවසන්ව පැවතියද නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණු අතර අනෙක් | මු.රෙ පරීක්ෂණ සිදුකර ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය |

| | | | | |
|---|---|---|---|---|
| | | වාහනයේ පරීක්ෂණ සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් අවසන් කර නොතිබුණි. | | |
| (ii) | මු. රෙ 371 (ඈ) | 2018 සිට සමාලෝචිත වර්ෂය දක්වා කාලය තුළ අවස්ථා 04 ක දී ලබාගෙන තිබුණු අත්තිකාරම් රු.60,810 ක් පියවා නොතිබුණි. | අදාළ නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරන බව |
| (iii) | මු. රෙ 571(3) | අවස්ථා 09කට අදාළ කාලය ඉක්මවූ විවිධ තැන්පතු රු.64,020 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | නිරවුල් කිරීමට කටයුතු කරන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරන බව |
| (ඈ) | 1993 අංක 02 දරන මධ්‍යම පළාතේ මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥප්තිය | වසර 02 ක කාලය ඉක්මවූ මුද්දර ගාස්තු ආදායම ලබාදිය නොහැකි බව දැක්වුවද 2012 සිට 2018 දක්වා මුද්දර ගාස්තු ආදායම නිරවුල් කර ගැනීමට 1,571,880කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව | නියමිත කාලය තුළ මුද්දර ගාස්තු ගෙන්වා ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,255,725 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 2,960,443 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,960,500 | 1,171,997 | 1,136,564 | 668,017 | 2,937,400 | 1,842,187 | 1,519,550 | 632,584 |
| (ii) | කුලී | 3,066,400 | 3,237,963 | 3,384,795 | 3,157,776 | 3,729,600 | 3,178,932 | 1,145,828 | 3,804,608 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 722,650 | 614,100 | 603,350 | 121,750 | 870,000 | 750,522 | 664,022 | 111,000 |
| (iv) | වෙනත් ආදායම් | 42,583,400 | 43,351,616 | 40,914,621 | 8,717,629 | 8,044,500 | 44,709,086 | 38,633,715 | 6,275,634 |
| | | 48,332,950 | 48,375,676 | 46,039,330 | 12,665,172 | 15,581,500 | 50,480,727 | 41,963,115 | 10,823,826 |

## 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

**සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධන සම්බන්ධ නිරීක්ෂණ දැක්වේ.**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| (i) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ වරිපනම් ශේෂය රු.493,636 ක් වූ අතර, ඒකකයක වරිපනම් හිඟය රු.10,000 ඉක්මවූ දේපල 06 කින් එකතුව රු.112,063 ක් විය. | ඉදිරියේදී හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව | පනතේ විධිවිධාන හා රීති ප්‍රකාරව ආදායම් අය කළ යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට 2005 වර්ෂයේ සිට අයවිය යුතු අක්කර බදු හිඟය රු.140,230 ක් අයකර නොතිබුණි. | අදාළ පාර්ශව දැනුවත් කර ඇති බව. | හිඟ ශේෂ අයකර ගත යුතුය. |
| **(ආ)** | **කඩ කුලී** | | |
| | පොදු වෙළඳ සංකීර්ණයේ කඩකාමර 14ක් වෙනුවෙන් 2018 මැයි 22 දින ලබාගත් නව තක්සේරු වාර්තාව 2019 ක්‍රියාත්මක කිරීමේ දී කඩ 06කින් එම තක්සේරුවට මුදල් ගෙවීම පැහැර හැර තිබුණු අතර 2020 වර්ෂයේ නඩු පැවරීමට කටයුතු කර තිබුණි. සමාලෝචිත වර්ෂය වන විට මෙම කඩ විවෘතව පැවති අතර මෙම කඩ කාමර 06ට අදාළව රු. 3,051,905 ක හිඟ කඩ කාමර කුලී ශේෂයක් පැවතුණි. | අතුරු තහනම් නියෝග නිකුත් කර ඇති බව. | නඩු තීරණ අනුව අවශා ක්‍රියාමාර්ග ගත යුතුය. |
| **(ඇ)** | **උසාවි දඩ හා මුද්දර ගාස්තු** | | |

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.807,922 ක් හා මුද්දර ගාස්තු රු.6,839,780 ක් විය. | හිඟ මුදල් ලබා ගැනීමට ඉල්ලීම් කර ඇති බව. | උසාවි දඩ හා මුද්දර ගාස්තු ගෙන්වා ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කායර්යන් ඉටු කිරීම**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ සභාවට අයත් උඩුදුම්බර ජල ව්‍යාපෘතියේ සිදුකර තිබුණු ජල සාම්පල් පරීක්ෂණ වාර්තාවන්ට අනුව කොලිෆෝම් (Coliform) බැක්ටීරියාව ඉතා ඉහළ අගයන් පැවතියදී ඒ පිළිබඳ කිසිදු සැලකිල්ලක් නොදක්වා බීමට නුසුදුසු අපවිත්‍ර ජලය මහජනතාවට බෙදා හැර තිබුණි. | අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව | අදාළ පරීක්ෂාවන් සිදු කර පිරිසිදු පානීය ජලය බෙදාහැරිය යුතුය. |

**3.2 කළමනාකරණ අකායර්ක්ෂමතා**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 05 ක එකතුව රු.7,495,432 ක් වූ අතර, ඉන් වසර 1 ත් 5 ත් අතර කාලයට අදාළ ගිණුම් ශේෂ එකතුව රු.4,219,014 ක් හා වසර 5 කට වැඩි කාලයක් පවතින එකතුව රු.241,510 ක් අයකර නොතිබුණි. | ඉදිරියේදී අයකරගැනීමට කටයුතු කරන බව. | ලැබිය යුතු ශේෂයන් අයකළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 02 ක එකතුව රු.9,413,275 ක් වූ අතර ඉදිරිපත් කරන ලද කාල විශ්ලේෂණයට අනුව වසර 1 ත් 5 ත් අතර කාලයට අදාළ ගිණුම් ශේෂ එකතුව රු.5,398,3207 ක් නිරවුල් කර නොතිබුණි. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුත කරන බව | ණයහිමි ශේෂයන් නිරවුල් කළ යුතුය. |

**3.3 නිෂ්කායර් හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එකතුව රු.3,298,644 ක වාහන 03 ක් හා යන්ත්‍ර 02 ක් වසර 03 සිට වසර 08 දක්වා කාල පරාසයක සිට නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිතව පැවතුණි. | අලුත්වැඩියා කිරීමට හා අපහරණය කිරීමට කටයුතු කරන බව | අලුත්වැඩියා කර හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2022 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසාන දින දක්වා සභා බල ප්‍රදේශයේ පවත්වාගෙන ගිය සති පොල ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. | නැවත ආරම්භ කිරීමට කටයුතු කරන බව | මහජන සේවාවන් පවත්වාගත යුතු අතර ආදායම් රැස්කිරීම කෙරෙහි අවධානය යොමුකළ යුතුය. |

**3.4 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු. 8,920,646 ක ප්‍රජා ශාලා 22 ක් පිහිටි ඉඩම් හා එකතුව රු.675,000 ක අම්බලන් 11 ක පිහිටි ඉඩම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයිතිය පවරා ගැනීමට කටයුතු කරන බව. | අයිතිය පවරා ගත යුතුය. |

**3.5 ව්‍යාපෘති, කතර්ව්‍යන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාර්ෂික අයවැය ලේඛන අනුව 2019 සිට සමාලෝචිත වර්ෂය දක්වා සංවර්ධන ව්‍යාපෘති 647 ක් සඳහා රු. 393,338,231 ක් සංවර්ධන කටයුතු සඳහා අනවධානයෙන් කටයුතු කර ප්‍රතිපාදන සලසා තිබුණද ඉන් රු. 9,872,712 ක් වැය කර ව්‍යාපෘති 08 ක් පමණක් ඉටු කිරීමට කටයුතු කර තිබුණි. | කොරෝනා වසංගතය හේතුවෙන් ඉටුකළ නොහැකි වූ බව | සැලසුම්කළ සංවර්ධන වැඩ ඉටුකළ යුතුය. |

**3.6 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අනුමත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්යමණ්ඩලය සැසඳීමේදී ඉන් තනතුරු 09 ක පුරප්පාඩු 14 ක් ද පැවතුණි. | බඳවාගත යුතු පුරප්පාඩු තනතුර නවතා දමා ඇති බව. | පුරප්පාඩු සම්පූර්ණ කරගත යුතුය. |

**4.** **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**
**තිරසර සංවධර්න අරමුණු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන පනතේ නියමයන්ට අනුව සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන තිබුණද ඒවා ලඟාකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී අරමුණු හා ඉලක්ක ලඟාකර ගැනීමට කටයුතු කරන බව. | අරමුණු හා ඉලක්ක හඳුනාගෙන ක්‍රියාත්මක කළ යුතුය. |